# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින පහත සඳහන් රැකියා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලාභී ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** - **01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,**
**මානව සම්පත් / පරිපාලන (තනතුරු 01)**

**02. කළමනාකරු - නීති (තනතුරු 01)**

**සුදුසුකම්** - **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් / පරිපාලන**

**(අ) බාහිර අපේක්ෂකයින්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගනු ලබන මානව සම්පත් / ව්‍යාපාර පරිපාලන / ව්‍යාපාර අධ්‍යයන / ව්‍යාපාර කළමනාකරණ / රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (Masters) උපාධියක්

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලය / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**(ආ) අභ්‍යන්තර අපේක්ෂකයින් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා සිටීම.
2. තනතුරට අදාළ වන ක්ෂේත්‍රයක කළමනාකරු ප්‍රවර්ගයේ (කාණ්ඩයේ) (MM) I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි සඳහන් පරිදි ඉහත තනතුරට අදාළ H.M. 1-1-2016 රුපියල් [80,295-15x2,270 - 114,345] වැටුප් පරිමාණය මෙම තනතුරට හිමිය.

**බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය -**

පත්වීම් ලබාදීමේ බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

- අදාළ අතිරේක පළපුරුද්ද - ලකුණු 30
- අදාළ අතිරේක අධ්‍යාපනික / වෘත්තිය සුදුසුකම් - ලකුණු 30
- වෙනත් සක්ෂාක්කර ගැනීම් (ජයග්‍රහණ) - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය - ලකුණු 25

**ලකුණු 100**

**වයස** - අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ඇත.

**වෙනත්** - මෙම කාණ්ඩයේ (ප්‍රවර්ගයේ) සියළු බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ විධිවිධාන හා ප්‍රතිපාදනවලට තදින්ම අනුකූල විය යුතුය.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හා තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකිවන මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

අනර්ඝ හා විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය

**අමතර ප්‍රතිලාභ** - අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රම පහසුකම්

සේවක අර්ථසාධක අරමුදලට (EPF) හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථ සාධක සමිතියට ඔබගේ වැටුපෙන් අවම වශයෙන් 10% ක එම අර්ථසාධක අරමුදල්වලට දායකත්වය සහ SLSPC (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ) හි එකී අර්ථසාධක අරමුදල්වලට උපරිම වශයෙන් 12% ක දායකත්වය සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) ඔබගේ වැටුපෙන් 3% ක සංස්ථාවේ දායකත්වය පිරිනැමේ.

නිල රථ වාහනයක් සහ ඉන්ධන දීමනාව පිරිනැමේ.

**කළමනාකරු - නීති**

**(අ) බාහිර අපේක්ෂකයින්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UCG) විසින් පිළිගනු ලබන නීතිවේදී (LLB) උපාධියක් සමග නීතිඥවරයෙකු වීම

සහ

කම්කරු නීතිය පිළිබඳ මනා දැනුම සහ නීති කටයුතු විචක්ෂණව, මනාව මෙහෙයවීමේ හැකියාව සමග නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු ලත් අවම වශයෙන් එක් වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**(ආ) අභ්‍යන්තර අප්‍රේක්ෂකයින්**

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළවන අවශ්‍ය සුදුසුකම් ලබා සිටීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 සඳහන් පරිදි ඉහත තනතුරට අදාළ වැටුප් පරිමාණය වන MM 1-1-2016 රුපියල් [53,175 - 10 x 1,375-15 x 1,910 - 95,575] වැටුප් පරිමාණය මෙම තනතුරට හිමිය.

**බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය -**

පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කරනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

- අදාළ අතිරේක පළපුරුද්ද - ලකුණු 30
- අදාළ අතිරේක සුදුසුකම් - ලකුණු 30
- වෙනත් සක්ෂාක්කර ගැනීම් (ජයග්‍රහණ) - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය - ලකුණු 25

**ලකුණු 100**

**වයස** - අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපායි.

**වෙනත් කරුණු** - මෙම කාණ්ඩයට (ප්‍රවර්ගයට) සිදු කරනු ලබන සියලු බඳවා ගැනීම්, මෙම බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ සැලසෙන විධිවිධාන හා ප්‍රතිපාදනවලට තදින්ම අනුකූල විය යුතුය.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හා තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකිවන මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

අනර්ඝ හා විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

**අමතර ප්‍රතිලාභ** - අභ්‍යන්තර සහ බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රම පහසුකම් හිමිවේ.

සේවක අර්ථසාධක අරමුදලට (EPF) හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථ සාධක සමිතියට ඔබගේ වැටුපෙන් අවම වශයෙන් 10% ක එම අර්ථසාධක අරමුදල්වලට දායකත්වය සහ SLSPC (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ) හි එකී අර්ථසාධක අරමුදල්වලට උපරිම වශයෙන් 12% ක දායකත්වය සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) ඔබගේ වැටුපෙන් 3% ක සංස්ථාවේ දායකත්වය පිරිනැමේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් සියලු විස්තර හා උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමග අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර පහත ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන ප්‍රමාද අයදුම්පත් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඔවුනගේ නිර්දේශද සමග ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :**

2022 ඔක්තෝබර් මස 26 වන දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC),**
**අංක 21, B.C.C. පරිශ්‍රය,**
**මීරානියා වීදිය, කොළඹ 12.**